සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/MF/BR/05 | ඔබේ අංකය / உமது இல / Your No: ........................ | දිනය / திகதி / Date: 2018.11.28 |

සියළුම සමෘද්ධි ප්‍රජාමුල බැංකු කළමණාකරුවන් හා

බැංකු සමිති කළමණාකරුවන් වෙත

**<u>2019 වසර සදහා සමෘද්ධි ප්‍රජාමුල බැංකු සහ බැංකු සමිති වල ලියාපදිංචිය අළුත් කිරිම.</u>**

සමෘද්ධි බැංකු හා බැංකු සමිති වල ලියාපදිංචිය අළුත් කිරිම සදහා යොමු කල උක්ත සමාංක දරණ 2018.02.01 දිනැති ලිපිය හා බැදේ.

එම ලිපිය මඟින්,2018 වසර සදහා සමෘද්ධි බැංකු සහ බැංකු සමිති වල ලියාපදිංචිය අළුත් කිරිම සඳහා අවශ්‍ය උපදෙස් නිකුත් කර ඇත.

2017 මාර්තු 07 දින නිකුත් කල 2009/08 අංක දරණ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදි ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ සදහන් නියෝග ප්‍රකාරව සමෘද්ධි බැංකු සහ සමෘද්ධි බැංකු සමිති සෑම වර්ෂයකම මාර්තු 31දිනට යටත් පිරිසෙන් දින 30 කට ප්‍රථම (නියෝග අංක 5(6) යටතේ ) ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරිම මඟින් ලියා පදිංචිය අළුත් කරණු ලැබිය යුතුය.

ඒ අනුව ඔබ විසින්,2019 ජනවාරි මස 31දිනට පෙර සමෘද්ධි බැංකුවේ සහ බැංකු සමිතියේ ලියාපදිංචිය අළුත් කිරිම සදහා අයදුම් පත් යොමු කල යුතුවේ.

මෙම ලියාපදිංචිය අළුත් කිරිමේ අයදුම් පත්‍ර ඉදිරිපත් කිරිමේ කටයුතු වලදි නියමිත දිනට අයදුම් පත්‍ර යොමු නොකිරිම සහ විශාල අඩුපාඩු සහිතව (අදාල නිලධාරින්ගේ සහ ප්‍රජා නායකයින්ගේ අත්සන් හා නිලමුද්‍රා නොමැති වීම, අසම්පුර්ණ අයදුම් පත්‍ර යොමු කිරිම,හා අදාල ඇමුණුම් රහිතව යොමු කිරීම වැනි) යොමු කිරිමේ අයහපත් තත්වයන් මඟ හරවා ගැනීම, පිණිස 2019 ජනවාරි 31 දිනට පෙර සියළුම සමෘද්ධි බැංකු විසින් මෙම ලියාපදිංචිය අළුත් කිරිම අයදුම් පත්‍රය හා චෙක්පත තම බලප්‍රදේශයේ බැංකු සමිති කළමණාකරු වෙත භාරදිය යුතුය.

**<u>සමෘද්ධි බැංකු සමිති කළමණාකරු විසින් මේ සමඟ ඇති පිරික්ෂුම් පත්‍රිකාව (Check list) අනුව අයදුම් පත්‍ර පරීක්ෂා කර</u>** තම බල ප්‍රදේශයේ සමෘද්ධි බැංකු වල හා බැංකු සමිතියේ අයදුම් පත්‍රය සහ චෙක්පත ලියාපදිංචි තැපැලෙන් හෝ පුද්ගලිකව රැගෙනවිත් 2019.02.15 දිනට පෙර අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මුල්‍ය වෙත භාරදිය යුතුය.

den.letter.2018.11.12


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramul

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මුල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 28877** |
| | | **Hot Line :0112-889007** | | | |

සමෘද්ධි බැංකු සහ බැංකු සමිති ලියාපදිංචිය අළුත් කිරිමේ ගාස්තුව රු.1000/-ක් වේ.අදාල චෙක්පත **<u>කළමණාකරු ලංකා බැංකුව සමෘද්ධි ප්‍රජාමුල බැංකු අංශයේ ආයෝජන ගිණුම් අංක 3417925 බැර පිණිස</u>** ලියා දින 60කට වලංගු වන පරිදි චෙක්පත යොමු කල යුතුය.මෙම ලියාපදිංචිය අළුත් කිරිමේ ගාස්තුව බැංකු මට්ටමේදි කේත අංක 2141 ගිණුමටද බැංකු සමිති මට්ටමේදි කේත අංක 6213 දරණ ගිණුමට හර කල යුතුය.

ලියාපදිංචිය අළුත් කිරිමේ අයදුම් පත්‍රය, ප්‍රජාමුල සංවිධාන තොරතුරු, මහ සභා සහ පාලක මණ්ඩල තොරතුරු,මුල්‍ය තත්ව විස්තර,ආදායම් ප්‍රකාශ තොරතුරු,සමෘද්ධි වෙබ් අඩවියේ සඳහන් කර ඇත.ප්‍රජා මුල සංවිධාන තොරතුරු ඉදිරිපත් කිරිමේදි නැවත සියළුම ප්‍රජා සංවිධාන තොරතුරු යොමු කිරිම අත්‍යාවශ්‍ය නොවන අතර සංශෝධිත තොරතුරු පමණක් යොමු කිරිම ප්‍රමාණවත්වේ.

සමෘද්ධි බැංකුවට සහ සමෘද්ධි බැංකු සමිතියට පාලක මණ්ඩලය හා විධායක කමිටුව පත් කිරිමේ උපදෙස් අංක ස/ප්‍ර/බැ/2017/06 හා 2017.03.17 දිනැති චක්‍රලේඛයේ උපදෙස් පරිදි වන අතර,එම පත්කිරීම් වලට අදාල උපදෙස් නොවෙනස්ව පවති.

2019 ජනවාරි 31 දිනට පෙර සමෘද්ධි බැංකු සහ බැංකු සමිති වල මහ සභා රැස්වීම් පවත්වා නව පාලක මණ්ඩලයේ හා විධායක කමිටුවේ සභාපතිගේ අත්සනින් ලියාපදිංචි අයදුම් පත්‍ර නියමිත දිනට ප්‍රථම (2019.02.15 දිනට පෙර) අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මුල්‍ය වෙත භාර දිය යුතුය.

සමෘද්ධි බැංකු සහ සමෘද්ධි බැංකු සමිති වාර්ෂික මහ සභා රැස්වීම් පැවැත්වීමේදි වැය කරණු ලබන සංග්‍රහ වියදම් සම්බන්ධ උපදෙස් අංක DSD/HO/MF/SBU/05 හා 2018.01.18 ලිපිය පරිදි වන අතර එම උපදෙස් නොවෙනස්ව පවති. ඒ අනුව එක් අයෙකුට උපරිම රු.300/-කට යටත්ව සංග්‍රහ වියදම් සඳහා මුදල් වැය කල හැක.

නියමිත දිනට අයදුම් පත්‍ර යොමු නොකරණ සමෘද්ධි බැංකු හෝ බැංකු සමිති, වලින් **<u>ලියාපදිංචි ගාස්තුවෙන් 50%ක දඩ මුදලක් අය කරණ බවද දන්වමි.</u>** සමෘද්ධි බැංකු සහ බැංකු සමිති වලට අදාල නියෝග ප්‍රකාරව සමෘද්ධි බැංකු හා බැංකු සමිති වල ලියාපදිංචිය නියමිත දිනට අළුත් කිරිමේ කටයුතු වල වගකීම සමෘද්ධි බැංකු සමිති කළමණාකරු වෙත පැවරේ.

ඉහත උපදෙස් අනුගමනය කරමින්,සමෘද්ධි බැංකු සහ බැංකු සමිති වල 2019 වසරට අදාල ලියාපදිංචිය අළුත් කිරිමේ අයදුම් පත්‍ර යොමු කරන ලෙස කාරුණිකව දන්වමි. මෙම ලියාපදිංචි කටයුතු පිළිබඳව යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍යවේ නම් දුරකථන අංක 011-3054528 හෝ 011 - 2 887469 අමතන ලෙසද වැඩිදුරටත් සඳහන් කරමි.

නිමල් කොටවලගෙදර

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් -

1. ලේකම්, නිවාස හා සමාජ සුභසාධන අමාත්‍යාංශය - දැ.ගැ.ස
2. දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/දිස්ත්‍රික් ලේකම් - දැ.ගැ.ස
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ - දැ.ගැ.පි සහ අ.ක.ස
4. ප්‍රාදේශිය ලේකම් - දැ.ගැ.පි
5. සියළුම අධ්‍යක්ෂවරුන්(සමෘද්ධි සං. දෙ. ) - දැ.ගැ.පි
6. ප්‍රධාන ගණකාධිකාරි - දැ.ගැ.පි
7. ප්‍රධාන අභ්‍යන්තර විගණක - දැ.ගැ.පි